සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
**Department of Samurdhi Development**

මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார,நுண்நிதிய, சுயதொழில்,மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No DSD/H0/04/LH/09/ගෙවතු2022 | ඔබේ අංකය<br>உமது இல<br>Your No ...................... | දිනය<br>திகதி<br>Date 2022.01.10 |

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් / දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,
සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්,
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂවරුන්,
සියළුම සමෘද්ධි කළමණාකරුවන් හා සමෘද්ධි සංවර්ධන නිලධාරීන් ඇතුළු සියලු නිලධාරීන් වෙත,

සෞභාග්‍යා ජාතික කෘෂි ගෙවතු සංවර්ධන වැඩසටහන - 2022

පසුගිය දෙවසර පුරා පැවති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් ශ්‍රී ලංකාවට සමාජීය හා ආර්ථිකමය වශයෙන් විවිධ අභියෝගයන්ට මුහුණපෑමට සිදුවිය. ආර්ථික වශයෙන් සිදුවූ බලපෑම මඟහරවා ගැනීමට රජය මේ වන විට විවිධ උපක්‍රම භාවිතා කරමින් සිටින අතර දිවයින පුරා පවතින ගෙවතු සංවර්ධනය කිරීම කෙරෙහි ද ප්‍රමුඛ අවධානය යොමු කර ඇත.

02. මේ යටතේ මුදල් අමාත්‍යාංශය විසින් සෞභාග්‍යා ජාතික කෘෂි ගෙවතු සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීමට නියමිත අතර ජනාධිපති ලේකම් කෘෂිකර්ම අමාත්‍යාංශය ඇතුළු රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්, වැවිලි අමාත්‍යාංශයේ ලේකම් සහ රාජ්‍ය සේවා හා පළාත් පාලන, අමාත්‍යාංශ ලේකම්ගේ අත්සනින් යුතු පොදු චක්‍ර ලේඛයක් මගින් මේ පිළිබඳව අවශ්‍ය උපදෙස් හා මඟ පෙන්වීම් ඉදිරියේදී ලබා දෙනු ඇත.

03. 2020 වර්ෂයේදී ඉඩම් පරිහරණ සැලසුම් දෙපාර්තමේන්තුව විසින් පර්චස් 20 ට අඩු, පර්චස් 20 ට වැඩි හා අක්කරයට වැඩි යන කාණ්ඩ 03 ක් ඔස්සේ ගෙවතු හඳුනාගෙන ඇති අතර සෞභාග්‍යා ජාතික කෘෂි ගෙවතු සංවර්ධන වැඩසටහන සඳහා මෙම ගෙවතු හිමියන් තෝරා ගැනීමට නියමිතය.

04. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ඉඩම් පරිහරණ සැලසුම් දෙපාර්තමේන්තුව විසින් හඳුනාගත් ඉඩම් කාණ්ඩයන්ට අනුව ප්‍රතිලාභීන් හඳුනා ගැනීම සිදු කළ යුතු වේ. හඳුනාගත් ප්‍රතිලාභීන් සඳහා අයදුම් පත්‍රයක් ප්‍රතිලාභියා විසින් සම්පූර්ණ කළ යුතු අතර ග්‍රාම නිලධාරී වසමේ නිලධාරීන් දෙදෙනා සහ ප්‍රජා මූල සංවිධානයේ සභාපති හෝ ලේකම් මෙම අයදුම් පත්‍රය නිර්දේශ කළ යුතුවේ. පර්චස් 20 ට අඩු ගෙවතු සඳහා රු. 5,000.00 ක මුදලක් ලබාදෙන අතර බිම් සැකසීම ආදී මූලික කටයුතු සඳහා රු.1,500.00 අත්තිකාරමක් ලබාදෙන අතර පර්චස් 20 ට වැඩි ගෙවතු සඳහා රු. 10,000.00 ක් වන අතර මෙහිදී අත්තිකාරම් මුදල රු. 3000.00 ක් වේ.

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Batt:

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන)<br>மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்)<br>Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director ( Micro Finance) | කාර්යාලය<br>அலுவலகப்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | Hot Line:0112-885582 | Hot Line: 01 |
| | | Hot Line :0112-889007 | | | |

05. ගෙවතු සඳහා පැල සැපයීමේ ප්‍රධාන වගකීම සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත බැවින් සෑම ග්‍රාම නිලධාරී වසමක්ම නියෝජනය වන අයුරින් පැල තවාන්කරුවන් හඳුනාගැනීම අනිවාර්ය වේ. දැනටමත් ක්‍රියාත්මක සක්‍රිය පැල තවාන් සමඟ සෑම ග්‍රාම නිලධාරී වසමකින්ම එක් පැල තවාන්හිමියෙකු 2022 ජනවාරි 21 දිනට පෙර හඳුනාගෙන jeevonopaya@gmail.com හෝ divinegumalh@yahoo.com විද්‍යුත් තැපැල් ලිපිනයන් මඟින් ජීවනෝපාය සංවර්ධන අංශය වෙත ලබාදෙන මෙන්කාරුණිකව දන්වමි.

06. මෙම ගෙවතු වගා සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී පහත සඳහන් කාල රාමුව අනුව කටයුතු කිරීම අවශ්‍ය වනු ඇත.

- තවාන්කරුවන් දැනුවත් කිරීම හා පුහුණුව ලබාදීම - 2022 පෙබරවාරි 05-07
- තවාන් බීජ සහ කොහුබත් පැලට් ලබාදීම - 2022 පෙබරවාරි 07-10
- ගෙවතුලාභීන් දැනුවත් කිරීම - 2022 පෙබරවාරි 15-20
- ගෙවතුලාභීන් වෙත තවාන් පැල බෙදාදීම - 2022 මාර්තු 25-31
- ගෙවතු වල පැල සිටුවීම - 2022 අප්‍රේල් මුල් සතිය

ඉහත කටයුතු සිදු කිරීමේදී එම ක්‍රියාකාරකම් වලට අදාල රේඛීය ආයතන වල ප්‍රාදේශීය නිලධාරීන් මඟින් නිරන්තරයෙන් අධීක්ෂණ කරනු ඇත.

මෙම ජාතික වැඩසටහන සාර්ථක කර ගැනීමට ඔබ ඇතුළු කාර්යය මණ්ඩලයෙන් ලැබෙන සහාය අගය කොට සලකමි.

ආර්.පී.බී. තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:-
1. ලේකම්, සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය - කා.දැ.ගැ.පි.
2. ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය - කා.දැ.ගැ.පි.
3. ප්‍රධාන මෙහෙයුම් නිලධාරී, ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්යයසාධන බලකාය - කා.දැ.ගැ.පි.